**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. } HRC/AP/65/2016/W

දිනය / திகதி / Date } 2022/02/07

පැමිණිලි පාර්ශවය : කේ.සුමතිපාල මයා,
අංක 289, සංගිලිකුළම,
රඹෑව.

වගඋත්තර පාර්ශවය :

1. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගලෙන්බිදුනුවැව.

2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.

3. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය :</u> **<u>HRC/AP/65/2016 (W)</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් පැමිණිල්ලට අදාළව කරුණු දක්වමින් සඳහන් කරනු ලබන්නේ, තමා වෘත්තියෙන් වාණිජ ගුරුවරයෙකු ලෙස ගුරු සේවයේ 1 වන පන්තියේ සේවය කරන බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ 35/2014 (1) දරණ 2014.12.15 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව තමා අන්තර්ග්‍රහණය කල යුත්තේ 6/2006 (xii) දරණ 2014.12.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන ii හි 10 තීරයේ සඳහන් 3 වන වැටුප් පියවර වන රු. 24,330/- බවත්, නමුත් වගඋත්තර

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் }

පාර්ශවය විසින් 2008.07.01 වන දිනට තමා අන්තර් ග්‍රහණය කර ඇත්තේ 6/2006 (xii) දරණ 2014.12.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ ii හි 09 වන තීරයේ සඳහන් 3 වන වැටුප් පියවර වන රු. 23,685/- ක් වන වැටුපෙහි හෙයින් තමාගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවයෙන් වාර්තා කැඳවා ඇති අතර, පළවන වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගලෙන්බිඳුනුවැව කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, පැමිණිලිකාර ගුරු මහතා වාණිජවේදී උපාධිය මත 1993.04.07 වන දින වාණිජ උපාධි ගුරුවරයෙකු ලෙස පත්වීම් ලබා පසුව 2000.08.01 දිනට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර ඇති බවත්, ගුරු සේවයේ 2 – 1 ශ්‍රේණියට උසස්වීම් ලබාදීමේදී ඒ සඳහා ලකුණු ලබාදී ඇති බවත්ය.

නව ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක දිනය වන 2008.07.01 වනවිට මෙම පැමිණිලිකරු ගුරු සේවයේ 1 ශ්‍රේණියේ ගුරුවරයෙක් වන බවත්, ඒ අනුව නව ගුරු සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (xii) පරිච්ඡේදයේ උපලේඛන ii භාවිතයෙන් හා පුහුණු වැඩසටහන් මඟින් ලබාදුන් උපදෙස් අනුව වැටුප් සැකසීම සිදුකර ඇති බවත්, අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය හා වැටුප් පරිවර්තනය සම්බන්ධයෙන් නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් උපදෙස් පතා ඇති බවත්, ඒ අනුව ලැබෙන උපදෙස් මත වැටුප් පරිවර්තනයේ වැරදි ඇත්නම් එය නිවැරදි කිරීමට කටයුතු කරන බවත්ය.

ඒ අනුව 3 වන වගඋත්තරකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගලෙන්බිඳුනුවැව වෙත 2016.03.04 දිනැතිව ලිපියක් යොමු කරමින් දන්වා ඇත්තේ, නව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව පැමිණිලිකාර කේ.සුමතිපාල මහතා අන්තර්ග්‍රහණය කර ඇති ආකාරය සහ වැටුප් පරිවර්තනය සිදුකර ඇති ආකාරය නිවැරදි බවයි.

2 වන වගඋත්තරකාර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අනුරාධපුර විසින් ද කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, නව ගුරු සේවා ව්‍යවස්ථාව නිකුත් කර ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශය වන බැවින් සහ කේ.සුමතිපාල මහතා නව ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුව ඇති වැටුප් පරිවර්තනය නිවැරදිව සිදුව ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් දැනුම්දී ඇති බැවින්, එම තීරණය පිළිගැනීමට සිදුවන බවයි.

ඒ අනුව පැමිණිලිකරු ඒ සම්බන්ධයෙන් ප්‍රතිවිරෝධතාවය දක්වමින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ, 2014.11.10 දිනැති 35/2014 චක්‍රලේඛනයේ ඡේද අංක 04, 06, 07 සහ 08 යන ඡේද

2014.12.05 දිනැති 35/2014 (1) චක්‍රලේඛනය මඟින් සංශෝධනය කර ඇති බවත්, පුහුණු ආයතනවලින් ලබාදුන් උපදෙස් නිවැරදිව අවබෝධ කර නොගෙන කටයුතු කර ඇති බවත්ය.

**කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී අනාවරණය වී ඇති කරුණු :-**

මෙම පැමිණිල්ලට අදාළව කිහිප අවස්ථාවකදීම කොමිෂන් සභාව හමුවේ පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු කොමිෂන් සභාවේ පරීක්ෂණය සඳහා පෙනී නොසිටි බැවින් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

අනතුරුව 2017.11.27 වන දින කොමිෂන් සභාව හමුවේ අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් රාජ්‍ය කළමණාකරණ සහකාර විසින් පැමිණිල්ලට අදාළව ප්‍රකාශ කර ඇත්තේ, ගුරු සේවා ව්‍යවස්ථාවේ පැවති යම් යම් ගැටළු සහගත තත්වයන් හේතුවෙන් මෙම ගැටළුව මතුවී ඇති බවත්, දැනට පවතින ගුරු සේවා ව්‍යවස්ථාවෙහි අදාළ වගන්ති සංශෝධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත්, ව්‍යවස්ථාව සංශෝධනය වූ විට පැමිණිලිකරුගේ ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීමට හැකි බවත්ය.

තවද දැනට යෝජිත සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කල පසු අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් හා වැටුප් කොමිෂම වෙතින් නිර්දේශ ලබා දී ඇති බවත්, එම නිර්දේශ ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සංශෝධනය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු පැමිණිලිකරුගේ ගැටළුවට විසඳුම් ලබා ගැනීමට හැකි බවත්, ඒ අනුව අදාළ ගැටළුව විසඳීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කටයුතු කරන බවත්ය.

**නිරීක්ෂණ :-**

2016.09.30 වන දිනැති කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගලෙන්බිදුනුවැව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිපිය අනුව අනුව පැමිණිලිකරු හට චක්‍රලේඛ 2005/4 අනුව ගුරු සේවයේ 2-11 සිට 2-1 අදාළ උසස්වීම් හා වැටුප් පරිවර්තනය සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

නමුත්, තම ගැටළුව විසඳීම සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනයක් අවශ්‍ය නොවන බවත්, තමා හට සාධාරණ වන්දි මුදලක් ලබාදීමට කටයුතු කරන ලෙසත් පැමිණිලිකරු විසින් ඉල්ලා ඇති බව නිරීක්ෂණය වේ.

එනමුත්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයන් අනුව කලාප අධ්‍යක්ෂකවරයා විසින් පැමිණිලිකරුට හිමි නියමිත වැටුප් තලයෙහි පිහිටුවා 2016.09.30 දිනැතිව අන්තර්ග්‍රහණය කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකාර කේ.සුමතිපාල මහතාට හිමි 2007.08.01 වන දින සිට 1 වන ශ්‍රේණියේ වැටුප් තලයේ පිහිටුවා ඇති බැවින්, 2016.09.30 දින දක්වා 35/2014 (1) දරණ 2014.12.15 වන දිනට අදාළ වැටුප් තලයේ හිඟ මුදල් ගෙවීමට අධ්‍යාපන අමාත්‍යාංශයට හැකියාව ඇති බවත්, ඒ සඳහා ගුරුසේවා ව්‍යවස්ථාව සංශෝධනයක් කිරීම අවශ්‍ය නොවන බවත් නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

එබැවින් එම වැටුප් තලය අනුව පැමිණිලිකරුට ලැබිය යුතු හිඟ මුදල ඔහු වෙත ලබානොදීම තුළින් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරමු.

**නිර්දේශය :-**

ඒ අනුව 2007.08.01 දින සිට 2016.09.30 දින දක්වා පැමිණිලිකරුට හිමි හිඟ මුදල ගෙවීමට කටයුතු කරන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරමු.

2022. 05. 02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධව කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

02/03

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. [illegible] Karunasiri
Commissioner
[illegible] Commission of Sri Lanka